# ඉතිහාසය

## අ.පො.ස. (උ/පෙළ)



The National e-learning Portal for The General Education

Start Your Learning Journey with e-thaksalawa

# යුරෝපා ඉතිහාසය

## බහුවර්ණ ප්‍රශ්න පත්‍රය ඉලක්ක කරගත් ඉගෙනුම් අන්තර්ගත

### පටුන


1. ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය
2. ඉස්ලාම් ශිෂ්ටාචාරය
3. යුරෝපයේ භූගෝලීය පිහිටීම
4. රටවල විශේෂ පුද්ගලයින්
5. ඉතාලිය එක්සත් කිරීම
6. ග්‍රීක ශිෂ්ටාචාරය
7. රෝම ශිෂ්ටාචාරය
8. වැඩවසම් ආක්‍රමණ
9. රුසියන් විප්ලවය
10. ප්‍රසිද්ධ ප්‍රකාශන
11. යුරෝපයේ රාජවංශ
12. එ.ජා.ස.අනුබද්ධිත ආයතන
13. යුරෝපයේ වෙනත් සංවිධාන
14. ග්‍රන්ථ කතුවරු හා සංකල්ප
15. යුරෝපයේ ඇති වූ සටන්
16. ඓතිහාසික ගිවිසුම්


## 01. ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය

- යුරෝපයේ ඇති වූ ප්‍රථම සංවිධානාත්මක ආගම විය.
- යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මෙම ආගමේ නිර්මාතෘ විය.
- වර්තමානය වන විට ලොව පුරා භාවිතා වන ක්‍රිස්තු වර්ෂ ක්‍රමය ආරම්භ වන්නේ යේසුස් වහන්සේගේ උපත මුල්කොට ගෙනය.
- රෝම අධිරාජ්‍යයේ ඔගස්ටස් සීසර්ගේ පාලන කාලයේ දී ජෙරුසෙලමේ දී (බෙත්ලෙහෙම) යේසුතුමාගේ උපත සිදු විය.
- පියා නසරත් හි ජෝෂප් වන අතර මව කන්‍යා මරිය මව්තුමිය විය.
- අවු.26 දී සහෝදර බැප්ටිස්ට්ගේ මඟ පෙන්වීම යටතේ ඝෞතිස්ම වූ අතර අනතුරුව සංචාරක දහම් දේශකයකු බවට පත් විය.
- ජුදාස් ඉස්කැරියොට්ගේ පාවා දීමෙන් පසු රෝම ආණ්ඩුකාර වරයා වූ පොන්ටියස් පිල්ටා ඔහුට විරුද්ධව රාජද්‍රෝහි චෝදනා එල්ල කොට කුරුසයේ තබා ඇණ ගසා මරා දමන ලදි.
- යේසුස් වහන්සේගේ මරණයෙන් අනතුරුව අපෝස්තලුවරුන් වශයෙන් හැඳින් වූ ඔහුගේ ශ්‍රාවකයන් විසින් යුදෙව්වන්ට කිතු දහම දේශනා කිරීම ආරම්භ කළහ.
- ක්‍රි.ව.3 සියවස් පමණ වන විට රෝම අධිරාජ්‍යයේ සියලු ප්‍රදේශවල හා සුළු ආසියානු ප්‍රදේශවල කිතු දහම ව්‍යාප්ත වී තිබිනි.
- කොන්ස්ටන්ටයින් අධිරාජ්‍යයා කිතු දහම වැලඳගෙන ක්‍රි.ව.313 දී මිලාන් ආඥාව මඟින් කිතු දහම රෝම අධිරාජ්‍ය තුළ නිත්‍යානුකූල ආගමක් බවට පත් කරන ලදි.


අන්තර්ගතය සකස් කිරීම : පී. ජී. එන්. දිවාංගනී මිය - ර/ ශ්‍රී නාරද මහා විද්‍යාලය , බලන්ගොඩ ,
එම්. ජනක පෙරේරා මයා - ර/මිටිපොල මහා විද්‍යාලය, ඇහැලියගොඩ
පරිගණක පිටු සකස් කිරීම : බී.එස්.එස්.කේ. රුහුණගේ මිය- බප/ජය/මුනිදාස තුමාරතුංග විද්‍යාලය, කඩුවෙල
අන්තර්ගතය පරීක්ෂා කිරීම : ඩබ්. දමයන්ති බණ්ඩාර මිය- කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල

Copyright © www.e-thaksalawa.moe.gov.lk

- ක්‍රි.ව.4 වන සියවස අගභාගයේදී තියඩෝසියස් අධිරාජයා විසින් සෙසු සියලු ආගම් මිථ්‍යා දෘෂ්ටික ආගම් ලෙස නම් කොට රෝම අධිරාජ්‍යයේ රාජ්‍ය ආගම බවට පත් කිරීම.
- ගෝල් දේශය (ප්‍රංශය) මුල්කොටගෙන තම රාජ්‍ය ගොඩනගාගත් ෆ්‍රැන්ක් ගෝත්‍රයේ ක්ලෝවියස් රජු කිතු දහම වැළඳ ගැනීම නිසා යුරෝපය තුළ කිතු දහම ව්‍යාප්ත විය.
- චාලිමේන් අධිරාජයාගෙන් ශුද්ධ රෝම අධිරාජ්‍ය තනතුර නිර්මාණ වීම කිතුනු දහම ව්‍යාප්තියේ වැදගත් සන්ධිස්ථානයක් විය.
- ක්‍රි.ව.590 දී මහා ග්‍රෙගරි පාප් වහන්සේ යටතේ පාප් තනතුර නිර්මාණය විය.
- ක්‍රිස්තු සභාව සමාජය මෙහෙය වන ප්‍රධාන බලවේගය බවට පත්වීම.
- යුරෝපීය නීති පද්ධතිය සඳහා සදාචාරාත්මක රාමුව සැකසීමට බලපෑවේය.
- මධ්‍ය කාලීන යුරොපයේ අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය පල්ලිය හා ආරාමයි.
- බොලොඤ්ඤා, පැරිස්, ඔක්ස්ෆර්ඩ් යන විශ්ව විද්‍යාල ආරම්භ වූයේ පල්ලියේ අනුග්‍රහය ඇතිවයි.
- ගොතික් හා රොමනෙක්ස් ගෘහ නිර්මාණ සම්ප්‍රදායන් අනුව දේවස්ථාන ඉදිකිරීම ආරම්භ විය.
- බටහිර ශාස්ත්‍රීය සංගීතයේ ආරම්භය හා වර්ධනය දේවස්ථානවල ගායනා හා පල්ලියේ සංගීත ඔස්සේ සිදුවිය.
- දුප්පතුන්ට රෝගීන්ට හා අසරණයන්ට උපකාර කිරීම ක්‍රිස්තියානි දහමේ ප්‍රධාන ඉගැන්වීම විය.මෙය රාජ්‍ය සුබසාධනයේ මුල් අවස්ථාව ලෙස සැලසේ.
- ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය යුරෝපයට දායද කරන ලද්දේ ආගමික විශ්වාසයන් පමණක් නොව එය යුරෝපයේ සමාජ ව්‍යුහය , දේශපාලන දර්ශනය සෞන්දර්යාත්මක රසවින්දනය හා බුද්ධිමය පදනම සකස් කළ බලවේගයයි.මේ දායාදයන් නූතන ලෝකයේ ද පදනම ලෙස තවමත් ක්‍රියාත්මක වේ.

## 02. ඉස්ලාම් ශිෂ්ටාචාරය

- ක්‍රි.ව.570 දී අරාබියේ මක්කම නගරයේ දී උපත ලද මහම්මත් නබි තුමා දේශනා කළ ධර්මය ඉස්ලාම් ධර්මය නමින් හැඳින් වේ.
- එම දහමට අනුව ලොව ඇති එකම දෙවියා "අල්ලා" ය.
- මෙම ධර්මය "ශුද්ධ වූ කුරාණයේ" අන්තර්ගත විය.
- ඉස්ලාම් ධර්මය වැළඳගත් අය "මුස්ලිම්වරුන්" නමින් හැඳින්විනි.
- ක්‍රි.ව.632 දී මහම්මත්තුමා මිය යන විට අරාබිය පුරා ඉස්ලාම් ධර්මය ව්‍යාප්තව පැවතිනි.
- මහම්මත්තුමාගෙන් පසු ආගම ව්‍යාප්ත කිරීමට පුරෝගාමීත්වය ගත් අය කාලිෆ් ලෙස හැඳින්විනි.
- මහම්මත්තුමාගේ අනුප්‍රාප්තිකයා වූ අබුබකර් පළමු කාලිෆ්වරයා ලෙස හැඳින් වේ.
- සිරියාව තුළ ඉස්ලාම් ධර්මය ව්‍යාප්ත කිරිමට අබුබකර් සමත් විය.
- දෙවන කාලිෆ්වරයා වූ ඔමාර් විසින් රෝම අධිරාජයා වූ හෙරක්ලීටස් පරාජය කොට සිරියාව, ඩැමැස්කසය පලස්තිනය, ෆිනීෂියාව, මෙසපොතේමියාව, ඊජිප්තුව, තෙක් ඉස්ලාම් අධිරාජ්‍ය ව්‍යාප්ත කරන ලදී.


Copyright © www.e-thaksalawa.moe.gov.lk

- ක්‍රි.ව.9 වන සියවස වන විට සිසිලිය හා ඉතාලි දකුනු කොටස ද යටත් කොට ගෙන මධ්‍යධරණී මුහුදේ ආධිපත්‍ය දිනා ගැනීමට මුස්ලිම්වරුන්ට හැකි විය.
- අනතුරුව නැගෙනහිර අප්‍රිකාව, මලයාව, ඉන්දුනීසියාව බටහිර චීනයේ ඇතැම් ප්‍රදේශ සහ ඉන්දියාව යන රටවල ඉස්ලාම් ධර්මය ව්‍යාප්ත විය.
- අනුප්‍රාප්තිකත්වය සඳහා ඇති වූ මතභේද මුල්කොට ගෙන මුස්ලිම්වරු සුන්නි හා ෂියා වශයෙන් කොටස් දෙකකට බෙදී ගියහ.
- බැග්ඩෑඩ්, කයිරෝ, ඩැමැස්කස්, කොරඩෝවා, සෙවිලේ සහ බාසිලෝනා වැනි විශ්ව විද්‍යාල රැසක් ආරම්භ විය.
- සම්භාව්‍ය ඉස්ලාම් සාහිත්‍ය කෘති අතර අල්කුරාණය, අරාබි නිසොල්ලාසය, එක් දහස් එක් රැය, රුබෙයියාට් සහ අල්තබාරිගේ අපෝස්තලුවරුන්ගේ රජවරුන්ගේ වෘතාන්තමය චරිත කතා ප්‍රමුඛස්ථානයක් ගනියි.
- ඉස්ලාම් ශිෂ්ටාචාරය තුළ වෛද්‍ය විද්‍යාව හා විද්‍යාත්මක දැනුම පුළුල් කිරිම  සඳහා රචනා වී ඇති ප්‍රධාන ග්‍රන්ථ කිහිපයකි.
  - ⇒ අවිසින්නා - වෛද්‍ය විද්‍යාවේ අත්පොත
  - ⇒ වෛද්‍ය විද්‍යාවේ පරිචය -  රශේස්
  - ⇒ දෘෂ්ටි විද්‍යාව - බස්රාවේ අල්හසන්
- ඊට අමතතරව ඉස්ලාම් ශිෂ්ටාචාරයෙන් ලොවට දායද කරන ලද දේවල් ලෙස,
  - ⇒ අල්රාසි විසින් වසූරිය රෝගය හඳුනා ගැනීම.
  - ⇒ ආරෝග්‍ය ශාලා ක්‍රමය යුරෝපයට හඳුන්වාදීම.
  - ⇒ රෝම ඉලක්කම් වෙනුවට හින්දු අරාබි ඉලක්කම් ක්‍රමය හඳුන්වාදීම.
  - ⇒ ත්‍රිකෝණමිතික ක්‍රමය දියුණු කිරිම.
  - ⇒ අක්ෂාංශ දේශාංශ ඇඳීම සඳහා නිවැරදි මිනුම් ක්‍රම භාවිතා කිරීම.
- ඉස්ලාම් ශිෂ්ටාචාරයෙන් ලද ආර්ථික දායාද වන්නේ,
  - ⇒ විදේශ වෙළදාම ප්‍රධාන ආර්ථිකය වීම
  - ⇒ බැග්ඩෑඩ් වැදගත් වෙළඳ මධ්‍යස්ථානයක් විය.
- ඉස්ලාම් ශිෂ්ටාචාරයේ කලාව හා ගෘහ නිර්මාණය යටතේ වැදගත් ලක්ෂණ කිහිපයකි.
  - ⇒ ස්පාඤ්ඤයේ ග්‍රැනඩාහි අල්හම්බ්‍රා මාලිගය සෙවිල්හි අල්කසාර්,බැග්ඩෑඩ් හි මහ පල්ලිය, සමාරා පල්ලිය ශ්‍රේෂ්ඨ නිර්මාණවලට උදාහරණ වේ.
  - ⇒ ගෘහ නිර්මාණවල විශේෂාංග ලෙස , අර්ධ ගෝලාකාර වහල ආරුක්කු සහ උස්කොත් ආදිිය දැක්විය හැකිය.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය සකස් කිරීම : පී. ජී. එන්. දිවාංගනී මිය - ර/ ශ්‍රී නාරද මහා විද්‍යාලය , බලන්ගොඩ ,
එම්. ජනක පෙරේරා මයා - ර/මිටිපොල මහා විද්‍යාලය, ඇහැලියගොඩ
පරිගණක පිටු සකස් කිරීම : බී.එස්.එස්.කේ. රුහුණගේ මිය- බප/ජය/මුනිදාස කුමාරතුංග විද්‍යාලය, කඩුවෙල
අන්තර්ගතය පරීක්ෂා කිරීම : ඩබ්. දමයන්ති බණ්ඩාර මිය- කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල
Copyright © www.e-thaksalawa.moe.gov.lk

## 03. භූගෝලීය පිහිටීම

### යුරෝපයේ ප්‍රධාන ගංගා




Copyright

- තේම්ස් - එංගලන්තය
- රයින් - ප්‍රංශය හා ජර්මනිය අතර
- සේන් - ප්‍රංශය
- ඊබ්‍රෝ - ස්පාඤ්ඤය
- ටාගුස් - පෘතුගාලය
- රෝන් - ස්විට්සර්ලන්තය
- ලොරේ - ප්‍රංශය
- පෝ - උතුරු ඉතාලිය
- ටයිබර් - ඉතාලිය
- ඩැනියුබ් - ඔස්ට්‍රියාව
- නීපර් } රුසියාව
- වෝල්ගා } රුසියාව
- එල්බ් - ජර්මනිය

අන්තර්ගතය සකස් කිරීම : පී. ජී. එන්. දිවාංගනී මිය - ර/ ශ්‍රී නාරද මහා විද්‍යාලය , බලන්ගොඩ ,
එම්. ජනක පෙරේරා මයා - ර/මිටිපොල මහා විද්‍යාලය, ඇහැලියගොඩ
පරිගණක පිටු සකස් කිරීම : බී.එස්.එස්.කේ. රුහුණගේ මිය- බප/ජය/මුනිදාස කුමාරතුංග විද්‍යාලය, කඩුවෙල
අන්තර්ගතය පරීක්ෂා කිරීම : ඩබ්. දමයන්ති බණ්ඩාර මිය- කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල
Copyright © www.e-thaksalawa.moe.gov.lk

## යුරෝපයේ ප්‍රධාන කඳු වැටි




- පිරනීස් කඳු වැටිය
- ඇල්ප්ස් කඳු වැටිය
- ඇපනයින් කඳු වැටිය
- කොකේසස්
- කාර්පේතියන්
- බෝල්කන්

Copyright ©


Copyright © www.e-thaksalawa.moe.gov.lk

## යුරෝපයේ සමුද්‍ර සන්ධි හා මුහුදු




| සමුද්‍ර සන්ධිය | මුහුදු |
|---|---|
| • ඩෝවර් සමුද්‍ර සන්ධිය - ඉංග්‍රීසි ඕඩය හා උතුරු මුහුද අතර<br>• ජීබෝල්ටා සමුද්‍ර සන්ධිය - අත්ලන්තික් සාගරය හා මධ්‍යධරණී මුහුද අතර<br>• ඩාවනල්ස් සමුද්‍ර සන්ධිය - ඊජියන් මුහුද හා මර්මරා මුහුද අතර<br>• බොස්පරස් සමුද්‍ර සන්ධිය - මර්මරා මුහුද හා කළු මුහුද අතර<br>• | • උතුරු මුහුද<br>• බෝල්ටික් මුහුද<br>• මධ්‍යධරණී මුහුද<br>• ටිරේනියන් මුහුද<br>• ආද්‍රියාතික් මුහුද<br>• අයෝනියන් මුහුද<br>• ඊජියන් මුහුද<br>• මර්මරා මුහුද<br>• කළු මුහුද<br>• ඇසෙව් මුහුද<br>• කැස්පියන් මුහුද |

Copyright © www.

අන්තර්ගතය සකස් කිරීම : පී. ජී. එන්. දිවාංගනී මිය - ර/ ශ්‍රී නාරද මහා විද්‍යාලය , බලන්ගොඩ ,
එම්. ජනක පෙරේරා මයා - ර/මිටිපොල මහා විද්‍යාලය, ඇහැලියගොඩ
පරිගණක පිටු සකස් කිරීම : බී.එස්.එස්.කේ. රුහුණගේ මිය- බප/ජය/මුනිදාස කුමාරතුංග විද්‍යාලය, කඩුවෙල
අන්තර්ගතය පරීක්ෂා කිරීම : ඩබ්. දමයන්ති බණ්ඩාර මිය- කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල
Copyright © www.e-thaksalawa.moe.gov.lk



## අග නගර

| | |
|---|---|
| • නොර්වේ - ඔස්ලෝ<br>• පින්ලන්තය - හෙල්සින්කි<br>• පෝලන්තය - වොර්සෝ<br>• බල්ගේරියාව - සෝෆියා<br>• හංගේරියාව - බුඩාපෙස්ට්<br>• ස්පාඤ්ඤය - මැඩ්රිඩ්<br>• එංගලන්තය - ලන්ඩන්<br>• ප්‍රංශය - පැරිස්<br>• පෘතුගාලය - ලිස්බන්<br>• ඉතාලිය - රෝමය<br>• ග්‍රීසිය - ඇතැන්ස් | • ජර්මනිය - බර්ලින්<br>• චෙකොස්ලෝවැකියාව - ප්‍රාග්<br>• රුසියාව - මොස්කව්<br>• ඔස්ට්‍රියාව - වියානා<br>• සර්බියාව - සරයේවෝ<br>• යුගොස්ලාවියාව - බෙල්ග්‍රේඩ්<br>• රුමේනියාව - බුකාරෙස්ට්<br>• ඩෙන්මාර්කය - කෝපන්හේගන්<br>• බෙල්ජියම - බ්‍රසල්ස්<br>• ස්වීඩනය - ස්ටොක්හෝම් |

## පසුගිය විභාග ප්‍රශ්න ඇසුරින්

- **නොගැලපෙන නම ලියන්න.**

(A/L 2022):

1. පිරනීස් 2. ඇපලාචියන් 3. ඇල්ප්ස් 4. ඇපනයින් 5. කොකේසස්

**(A/L 2021):**

1. තේම්ස් 2.එල්බ් 3. ඩැන්සිග් 4. විස්ටියුලා 5. පෝ

**(A/L 2020):**

1. මර්මරා 2.ඊජියන් 3. ආද්‍රියාතික් 4. ආක්ටික් 5. බෝල්ටික්

**(A/L 2019):**

1. ඇසොව් 2.ඇල්පස් 3. ඇපනයින් 4. කොකේසස් 5. පිරනීස්

**(A/L 2018):**

1. ටයිබර් 2. තේම්ස් 3. ටාගුස් 4. විස්ටියුලා 5. කීල්

**(A/L 2017):**

1. මර්මරා 2. අසොව් 3. ඊජියන් 4. කැස්පියන් 5. පැසිපික්

**(A/L 2016):**

1. පිරනිස් 2. ඇල්ප්ස් 3. ඇපනයින් 4. කැස්පියන් 5. කාර්පේතියන්

**(A/L 2016):**

1. අයෝනියන් 2. ඊජියන් 3. කැස්පියන් 4. ආද්‍රියාතික් 5. මධ්‍යධරණී

අන්තර්ගතය සකස් කිරීම : පී. ජී. එන්. දිවාංගනී මිය - ර/ ශ්‍රී නාරද මහා විද්‍යාලය , බලන්ගොඩ ,
එම්. ජනක පෙරේරා මයා - ර/මිටිපොල මහා විද්‍යාලය, ඇහැලියගොඩ
පරිගණක පිටු සකස් කිරීම : බී.එස්.එස්.කේ. රුහුණගේ මිය- බප/ජය/මුනිදාස තුමාරතුංග විද්‍යාලය, කඩුවෙල
අන්තර්ගතය පරීක්ෂා කිරීම : ඩබ්. දමයන්ති බණ්ඩාර මිය- කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල
Copyright © www.e-thaksalawa.moe.gov.lk

- **නොගැලපෙන යුගලය ලියන්න. (A/L 2022):**

1. ඩාඩනල්ස් සමුදු සන්ධිය - මොරොක්කොව හා ස්පාඤ්ඤය
2. ඉංග්‍රිසි ඕඩය - ප්‍රංශය හා එංගලන්තය
3. සුවස් ඇළ - රතු මුහුද හා මධ්‍යධරණී මුහුද
4. පැනමා ඇළ - අත්ලාන්තික් සාගරය හා පැසිපික් සාගරය
5. කීල් ඇළ - උතුරු මුහුද හා බෝල්ටික් මුහුද

- **X හා Y ගලපන්න.(A/L 2024)**

| X | Y |
|---|---|
| 1. ටයිබර් | A. වියානා |
| 2. සේන් | B. ලිස්බන් |
| 3. ඩැනියුබ් | C. වෝර්සෝ |
| 4. ටාගුස් | D. රෝමය |
| 5. විස්ටියුලා | E. පැරිස් |

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය සකස් කිරීම : පී. ජී. එන්. දිවාංගනී මිය - ර/ ශ්‍රී නාරද මහා විද්‍යාලය , බලන්ගොඩ ,
එම්. ජනක පෙරේරා මයා - ර/මිටිපොල මහා විද්‍යාලය, ඇහැලියගොඩ
පරිගණක පිටු සකස් කිරීම : බී.එස්.එස්.කේ. රුහුණගේ මිය- බප/ජය/මුනිදාස තුමාරතුංග විද්‍යාලය, කඩුවෙල
අන්තර්ගතය පරීක්ෂා කිරීම : ඩබ්. දමයන්ති බණ්ඩාර මිය- කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල
Copyright © www.e-thaksalawa.moe.gov.lk

## 04. ලෝක ඉතිහාසයේ විශේෂ පුද්ගලයන්

| අංකය | පුද්ගලයා / නායකයා | ඓතිහාසික වැදගත්කම / සංකල්පය |
|---|---|---|
| 01 | ක්ලෙයිස්තිනීස් | ඇතීනියානු ප්‍රජාතන්ත්‍රවාදයේ පියා |
| 02 | හෙරඩෝටස් | ඉතිහාසයේ පියා |
| 03 | හිපොක්‍රටීස් | වෛද්‍ය විද්‍යාවේ පියා |
| 04 | ඔක්ටේවියන් (ඔගස්ටස් සීසර්) | පළමුවන (I) රෝම අධිරාජයා |
| 05 | පෙට්රාක් | මානවවාදයේ පියා |
| 06 | නැපෝලියන් බොනපාට් | මහාද්වීපික ක්‍රමය (Continental System) |
| 07 | ඔටෝ වොන් බිස්මාර්ක් | ලේ සහ යකඩ ප්‍රතිපත්තිය / ජර්මනිය එක්සේසත් කළ ප්‍රථම චාන්සලර්වරයා |
| 08 | වී. අයි. ලෙනින් | නව ආර්ථික ප්‍රතිපත්තිය (NEP) / නිර්ධන පන්තික ආඥාදායකත්වය |
| 09 | ජෝර්ජ් මාෂල් | මාෂල් සැලැස්ම (Marshall Plan) |
| 10 | මිහායෙල් ගොර්බචොෆ් | පෙරෙස්ත්‍රොයිකා (ආර්ථික ප්‍රතිව්‍යුහගතකරණය) සහ ග්ලාස්නොස්ට් ප්‍රතිපත්තිය / සෝවියට් දේශයේ අවසන් පාලකයා |
| 11 | මොන්ටෙස්ක්‍යු | බලතල වෙන් කිරීමේ සිද්ධාන්තය (Separation of Powers) |
| 12 | ජීන් ජැක් රූසෝ | සමාජ සම්මුති වාදය (Social Contract Theory) |
| 13 | ජෙරමි බෙන්තම් | උපයෝගිතාවාදය (Utilitarianism) |
| 14 | කාල් මාක්ස් | විද්‍යාත්මක සමාජවාදය (Marxism) |
| 15 | ඇලෙක්සැන්ඩර් කෙරෙන්ස්කි | තාවකාලික ආණ්ඩුවේ නායකයා (1917 මාර්තු රුසියානු විප්ලවය) |
| 16 | ලියොන් ට්‍රොට්ස්කි | රතු හමුදාවේ සංවිධායක / නොනවතින විප්ලවය සංකල්පය |
| 17 | ජෝසෆ් ස්ටාලින් | තනි රටේ සමාජවාදය / පස් අවුරුදු සැලැස්ම |
| 18 | නිකිතා කෲෂෙෆ් | සාමකාමී සහජීවනය (Peaceful Coexistence) |
| 19 | ක්ලෙමන් ඇට්ලී | දෙවන ලෝක යුද්ධයෙන් පසු බ්‍රිතාන්‍යයේ ප්‍රථම අගමැති |
| 20 | කොන්රාඩ් ඇඩිනුවර් | බටහිර ජර්මනියේ ප්‍රථම චාන්සලර්වරයා |
| 21 | ලෙච් වලේසා | පෝලන්තයේ 'සොලිඩැරිටි' (Solidarity) කම්කරු සමිතියේ නායකයා |
| 22 | රොබට් වෝල්පෝල් | බ්‍රිතාන්‍යයේ ප්‍රථම අගමැතිවරයා |
| 23 | ජෝර්ජ් වොෂින්ටන් | ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රථම ජනාධිපතිවරයා |
| 24 | චාල්ස් ඩි ගෝල් | ප්‍රංශයේ 5 වන සමූහාණ්ඩුවේ ප්‍රථම ජනාධිපතිවරයා |
| 25 | ඌ තාන්ට් (U Thant) | එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රථම ආසියාතික මහලේකම්වරයා |

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය සකස් කිරීම : පී. ජී. එන්. දිවාංගනී මිය - ර/ ශ්‍රී නාරද මහා විද්‍යාලය , බලන්ගොඩ ,
එම්. ජනක පෙරේරා මයා - ර/මිටිපොල මහා විද්‍යාලය, ඇහැලියගොඩ
පරිගණක පිටු සකස් කිරීම : බී.එස්.එස්.කේ. රුහුණගේ මිය- බප/ජය/මුනිදාස කුමාරතුංග විද්‍යාලය, කඩුවෙල
අන්තර්ගතය පරීක්ෂා කිරීම : ඩබ්. දමයන්ති බණ්ඩාර මිය- කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල
Copyright © www.e-thaksalawa.moe.gov.lk

| අංකය | පුද්ගලයා / නායකයා | ඓතිහාසික වැදගත්කම / සංකල්පය |
|---|---|---|
| 26 | මාර්ෂල් ටිටෝ | යුගෝස්ලාවියාවේ ජනාධිපතිවරයා / නොබැඳි පිළිවෙතේ පුරෝගාමියෙක් |
| 27 | ඩැග් හැමර්ෂෙල් | එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දෙවන මහලේකම්වරයා |
| 28 | ට්‍රිග්වී ලී | එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රථම මහලේකම්වරයා |
| 29 | මාග්‍රට් තැචර් | බ්‍රිතාන්‍යයේ ප්‍රථම කාන්තා අගමැතිනිය (යකඩ ගැහැනිය) |
| 30 | විලි බ්‍රාන්ට් | බටහිර ජර්මනියේ චාන්සලර්වරයා (Ostpolitik ප්‍රතිපත්තිය) |
| 31 | කුර්ට් වෝල්ඩ්හයිම් | එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සිව්වන මහලේකම්වරයා |
| 32 | කොෆි අනන් | එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සත්වන මහලේකම්වරයා |
| 33 | නිකිතා කෘෂෙෆ් | රුසියානු (සෝවියට්) දේශපාලනඥයෙක් / රාජ්‍ය නායකයෙක් |
| 34 | ලියොනිඩ් බ්‍රෙෂ්නොෆ් | රුසියානු (සෝවියට්) දේශපාලනඥයෙක් / රාජ්‍ය නායකයෙක් |
| 35 | යූරි අන්ද්‍රපොෆ් | රුසියානු (සෝවියට්) දේශපාලනඥයෙක් / රාජ්‍ය නායකයෙක් |
| 36 | ඇලෙක්සැන්ඩර් සොල්සෙනිට්සින් | සුප්‍රකට රුසියානු ලේඛකයෙක් සහ විචාරකයෙක් (Nobel ලාභී) |
| 37 | විලියම් පිට් | බ්‍රිතාන්‍යයේ ලාබාලතම අගමැතිවරයා |
| 38 | ඔලිවර් ක්‍රොම්වෙල් | බ්‍රිතාන්‍ය සමූහාණ්ඩුවක් (Commonwealth) කළ හමුදා නායකයා |
| 39 | විලියම් ග්ලැඩ්ස්ටන් | බ්‍රිතාන්‍යයේ ලිබරල් පක්ෂ අගමැතිවරයෙකි |
| 40 | බෙන්ජමින් ඩිස්‍රායෙලි | බ්‍රිතාන්‍යයේ කොන්සර්වේටිව් පක්ෂ අගමැතිවරයෙකි (දේශීය ප්‍රතිසංස්කරණ) |
| 41 | ජීන් බෝඩින් | ප්‍රංශ දේශපාලන දාර්ශනිකයෙකි (රාජ්‍ය ස්වෛරීභාවය පිළිබඳ සංකල්පය) |
| 42 | තෝමස් හොබ්ස් | ඉංග්‍රීසි දාර්ශනිකයෙක් (ලෙවියාතන් ග්‍රන්ථයේ කර්තෘ) |
| 43 | ජෝන් ලොක් | ඉංග්‍රීසි දාර්ශනිකයෙක් (දෙවන ලෝක විප්ලවයන්ට/ඇමරිකානු විප්ලවයට පදනම වූ මතවාද) |
| 44 | ඇලෙක්සි කොසිජින් | සෝවියට් සංගමයේ ප්‍රමුඛ අගමැතිවරයෙක් |
| 45 | තෝමස් ජෙෆර්සන් | ඇමරිකානු නිදහස් ප්‍රකාශනයේ නිර්මාණකරු සහ 3 වන ජනාධිපතිවරයා |
| 46 | ඇන්ඩෘ ජැක්සන් | ඇමරිකා එක්සත් ජනපදයේ 7 වන ජනාධිපතිවරයා |
| 47 | ඇඩම් ස්මිත් | ආර්ථික විද්‍යාවේ පියා / රාජ්‍ය නිර්බාධ වාදය (Laissez-faire) |
| 48 | ජෝන් ස්ටුවර්ට් මිල් | ඉංග්‍රීසි දාර්ශනිකයෙක් සහ දේශපාලන ආර්ථික විද්‍යාඥයෙක් (උපයෝගිතාවාදය) |
| 49 | වුඩ්රෝ විල්සන් | ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපති (ජාතීන්ගේ සංගමය / League of Nations සංකල්පය) |
| 50 | ඩේවිඩ් රිකාඩෝ | ප්‍රකට ඉංග්‍රීසි සම්භාව්‍ය ආර්ථික විද්‍යාඥයෙක් |

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය සකස් කිරීම : පී. ජී. එන්. දිවාංගනී මිය - ර/ ශ්‍රී නාරද මහා විද්‍යාලය , බලන්ගොඩ ,
එම්. ජනක පෙරේරා මයා - ර/මිටිපොල මහා විද්‍යාලය, ඇහැලියගොඩ
පරිගණක පිටු සකස් කිරීම : බී.එස්.එස්.කේ. රුහුණගේ මිය- බප/ජය/මුනිදාස කුමාරතුංග විද්‍යාලය, කඩුවෙල
අන්තර්ගතය පරීක්ෂා කිරීම : ඩබ්. දමයන්ති බණ්ඩාර මිය- කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල
Copyright © www.e-thaksalawa.moe.gov.lk

- **නොගැලපෙන නම ලියන්න.**

  1.ජොර්ජ් වොෂිංටන්

  2.ජෝන් ඇඩම්ස්

  3.තෝමස් ජෙෆර්සන්

  4. විලියම් පිට්

  5. ඇලෙක්සැන්ඩර් හැමිල්ටන් **(A/L 2022)**

- **X හා Y ගලපන්න.**

| X | Y |
|---|---|
| I. මාර්ෂල් ටිටෝ | A. ප්‍රංශයේ 4 වන සමුහාණ්ඩුවේ ප්‍රථම ජනාධිපති |
| II. චාල්ස් ඩී ගෝල් | B. දෙවන ලෝක යුද්ධයෙන් පසු බ්‍රිතාන්‍ය ප්‍රථම අගමැති |
| III. ක්ලෙමන් ඇට්ලි | C. යුගොස්ලෝවියානු ජනාධිපති |
| IV. ට්‍රිග්වි ලි | D. බ්‍රිතාන්‍ය ප්‍රථම කාන්තා අගමැතිනි |
| V. මාග්‍රට් තැචර් | E. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රථම මහලේකම්වරයා |

**(A/L 2020)**

| X | Y |
|---|---|
| I. වී.අයි.ලෙනින් | A. රතු හමුදාව |
| II. ලියොන් ට්‍රොට්ස්කි | B. බටහිර සමඟ සාමකාමී සහජීවනය |
| III. ජොෂප් ස්ටාලින් | C. විවෘතභාවය හා ආර්ථික ප්‍රතිව්‍යුහකරණය |
| IV. නිකිතා කෘෂෙෆ් | D. පස් අවුරුදු සැලැස්ම |
| V. මිහායෙල් ගොර්භචොෆ් | E. නව ආර්ථික ප්‍රතිපත්තිය |

**(A/L 2021)**

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය සකස් කිරීම : පී. ජී. එන්. දිවාංගනී මිය - ර/ ශ්‍රී නාරද මහා විද්‍යාලය , බලන්ගොඩ ,
එම්. ජනක පෙරේරා මයා - ර/මිටිපොල මහා විද්‍යාලය, ඇහැලියගොඩ
පරිගණක පිටු සකස් කිරීම : බී.එස්.එස්.කේ. රුහුණගේ මිය- බප/ජය/මුනිදාස කුමාරතුංග විද්‍යාලය, කඩුවෙල
අන්තර්ගතය පරීක්ෂා කිරීම : ඩබ්. දමයන්ති බණ්ඩාර මිය- කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල
Copyright © www.e-thaksalawa.moe.gov.lk

## 05. ඉතාලිය එක්සත් කිරීම

1. **එක්සත් වීමට පෙර ඉතාලිය**
   - ඉතාලියේ පැවති දේශපාලනික බෙදීම් (ක්‍රි.ව.1800 වන විට ඉතාලිය රාජ්‍ය 300 කට පමණ බෙදී තිබුණි)
   - විවිධ ජාතීන් විවිධ ප්‍රදේශවල පාලන බලය ලබාගෙන සිටීම.
   - නැපෝලියන්ගේ ග්‍රහණයට යටත් වූ ඉතාලිය එක්සත් සමූහ ආණ්ඩුවක් මෙන් පාලනය වූ බැවින් එක්සත්භාවය පිළිබඳව හැඟීමක් ඉතාලි ජනතාව තුළ ඇතිවීම.
   - ජාතිවාදී හැඟීම් ඇති වීම .

2. **ඉතාලිය එක්සත් කිරීමට තිබූ බාධක**
   - විදේශ ආධිපත්‍ය ( ප්‍රධාන වශයෙන්ම ඕස්ට්‍රියාවේ හා ස්පාඤ්ඤයේ බලය පැතිරීම)
   - පාප් වහන්සේගේ බලය.
   - විවිධ රාජ්‍ය වලට බෙදී, විවිධ නීතිරීති යටතේ පාලනය වූ තත්ත්වයක් පැවති බැවින් ජනතාව අතර ජාති මමත්වයක් වෙනුවට භේදකාරී හැඟීම් ගොඩනැඟීම.

3. **ඉතාලිය එක්සත් කිරීමට දරණ ප්‍රයත්නය හා සම්බන්ධ ව්‍යාපාර**
   - කාබොනාරී ව්‍යාපාරය, මැසිනිගේ තරුණ ඉතාලිය.
   - ෆෙඩරල් වාදීන් හා සැවෝයි රජවංශයේ පාලනයට කැමති වූ අය එක්සත් කිරීමේ ව්‍යාපාරය සඳහා ඉදිරිපත් වීම.
   - නව ගුවෙල්ෆ් ව්‍යාපාරය හා කැරලි.
   - මේවා ශක්තිමත් ව්‍යාපාර නොවූ බැවින් එක්සත් කිරීමේ අරමුණු ඉටුකර ගත නොහැකි වීම.

4. **ඉතාලි එක්සත් කිරීමේ ව්‍යාපාරයට දායක වූ අය**
   - නැපෝලියන් බොනපාට්, ජෝසප් මැසිනි, කැමිලෝ කැවුවර්, ගුසෙප් ගැරිබෝල්ඩි
   - කැවුන්ට් කැව්වර් බලයට පත්වීම, ලිබරල් වාදීන්ගේ සහය ලැබීම, ඉතාලිය එක්සත් කිරීමේ ව්‍යාපාරයේ නායකත්වය පීඩ්මොන්ට් රාජ්‍යයට හිමිවීම.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය සකස් කිරීම : පී. ජී. එන්. දිවාංගනී මිය - ර/ ශ්‍රී නාරද මහා විද්‍යාලය , බලන්ගොඩ ,
එම්. ජනක පෙරේරා මයා - ර/මිටිපොල මහා විද්‍යාලය, ඇහැලියගොඩ
පරිගණක පිටු සකස් කිරීම : බී.එස්.එස්.කේ. රුහුණගේ මිය- බප/ජය/මුනිදාස තුමාරතුංග විද්‍යාලය, කඩුවෙල
අන්තර්ගතය පරීක්ෂා කිරීම : ඩබ්. දමයන්ති බණ්ඩාර මිය- කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## ප්‍රශ්න අංක 01

- **ඉතාලිය එක්සේසත් කිරීමට තිබූ ප්‍රධාන බධක කවරේද එම බාධක ජය ගනිමින් ඉතාලිය එක්සේසත් කළ ආකාරය පරීක්ෂා කරන්න.**

1. **ඉතාලිය එක්සේසත් කිරීමට තිබූ බාධක (1815 – 1848 ක්‍රි.ව.)**
   - ඉතාලිය යනු භූගෝලීය ප්‍රදේශයක් පමණි.
   - ඉතාලිය ස්වාධීන රාජ්‍ය ගණනාවකය බෙදී පැවතීම.
   - එම රාජ්‍යවලින් අති විශාල සංඛ්‍යාවක් විදේශීය ආධිපත්‍යයන් යටතේ පැවතීම.
   - ඉතාලිය තුළ බලපැවැත් වූ ඔස්ට්‍රියානු ආධිපත්‍ය හා ඔස්ට්‍රියානු බලය.
   - වියානා සමතයේ තීරණ.
   - පාප් රාජ්‍ය හා පාප් වහන්සේ විරෝධය (1848 න් පසු)
   - ඉතාලිය එක්සත් කිරීම සම්බන්ධයෙන් ඒකාබද්ධ ක්‍රියාමාර්ගයක් ඉදිරිපත් නොවීම හා විවිධ පුද්ගලයින් හා ව්‍යාපාර , විවිධ ක්‍රියා මාර්ග ඉදිරිපත් කිරීම.
   - ජාතිවාත්සල්‍යය , ජාතිකානුරාගය ප්‍රමාණවත් ලෙස ප්‍රචලිතව නොතිබීම.

2. **එම බාධක ජය ගනිමින් ඉතාලිය එක්සේත් කළ ආකාරය 1848**
   - 1848 විප්ලව වර්ෂයේ දී ඉතාලි රාජ්‍යවල සටන් ඇතිවීම.
   - 1859 ඔස්ට්‍රෝ - සාර්ඩියානු යුද්ධය සාර්ඩිනියාව ඔස්ට්‍රියාවෙන් ලෝම්බාර්ඩිය ලබා ගැනීම, මධ්‍යම ඉතාලි රාජ්‍ය සාර්ඩීනියාවට ඒකාබද්ධ වීම.( ගැරිබෝල්ඩි දකුණු ඉතාලිය ආක්‍රමණය කිරීම)
   - 1866 ඔස්ට්‍රෝ ප්‍රෂියානු යුධ අවස්ථාවේදී ප්‍රෂියාවේ සහයෝගයෙන් වෙනීෂියාව ඉතාලියට ඈඳා ගැනීම.
   - 1870 ප්‍රංශ -ප්‍රෂියානු යුධ අවස්ථාවේ දී රෝමය ඈදාගෙන ඉතාලි එක්සත්භාවය මුළුමනින්ම සාර්ථක කර ගැනීම.

- මැසිනි සිය තරුණ ඉතාලිය නම් සංවිධානය මඟින් ජාති වාත්සල්‍යය හා ඉතාලි එක්සත්භාවය පිළිබඳ හැඟීම් වර්ධනය කිරීමටත්, කැවුවර් හා වික්ටර් එමැනුවෙල් රජු ප්‍රංශ හා ප්‍රෂියානු ආධාර ලබාගෙන ඉතාලියෙන් ඔස්ට්‍රියානු බලය පලවා හැරීමත්, ගැරිබෝල්ඩි දකුණු ඉතාලි ප්‍රදේශ විදේශාධිපත්‍යයෙන් මුදවා ගැනීමත්, මඟින් බටහිර ඉතාලිය එක්සත් කිරීමට පැවති බාධක ජයගත් ආකාරය , ඉහත දැක්වෙන ඉතාලි එක්සත් කිරීමේ ව්‍යාපාරයේ ප්‍රධාන අවස්ථා ඇසුරින් විග්‍රහ කිරීමක් සිදුකළ යුතුය.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය සකස් කිරීම : පී. ජී. එන්. දිවංගනී මිය - ර/ ශ්‍රී නාරද මහා විද්‍යාලය , බලන්ගොඩ ,
එම්. ජනක පෙරේරා මයා - ර/මිටිපොල මහා විද්‍යාලය, ඇහැලියගොඩ
පරිගණක පිටු සකස් කිරීම : බී.එස්.එස්.කේ. රුහුණගේ මිය- බප/ජය/මුනිදාස කුමාරතුංග විද්‍යාලය, කඩුවෙල
අන්තර්ගතය පරීක්ෂා කිරීම : ඩබ්. දමයන්ති බණ්ඩාර මිය- කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල
Copyright © www.e-thaksalawa.moe.gov.lk

## ප්‍රශ්න අංක 02

- **ඉතාලිය එක්සත් කිරීමෙහි ලා ජෝසප් මැසිනි, කැව්වර් හා ගැරි බෝල්ඩ් යන අයගේ කාර්යයේ සාපේක්ෂ වැදගත්කම පරීක්ෂා කරන්න**
  - * මෙම නායකයන් තිදෙනා ඉතාලිය එක්සත් ව්‍යාපාරයේ ප්‍රධාන අවස්ථා තුනක් නියෝජනය කරති.

**I ජෝසප් මැසිනි**

- ඉතාලියේ පැවති විදේශාධිපත්‍ය ඉවත් කිරීම සඳහා කාබෝනාරි නම් රහස් සංවිධානය ගෙන ගිය සටන් අසාර්ථක වීමෙන් පසු මැසිනි ජාතික නායකයෙකු ලෙස නැගී ඒම.
- තරුණ ඉතාලිය නම් සංවිධානය පිහිටුවීම හා තරුණයින් හා බුද්ධිමතුන් ඒ වෙත ඒකරාශි කර ගැනීම (ඉතාලිය එක්සත් කිරීම) ඉතාලි ජාතිකයන්ට තනිව කළ හැකි බව ඔහු විශ්වාස කළේය.
- ලිබරල්වාදියෙකු වූ මොහු ඔස්ට්‍රියානු විරෝධි පුළුල් ජන සහභාගිත්වයකින් යුත් සටනක් ජය ගැනීමෙන් පසු එක්සත් ඉතාලියක් ගොඩනැගීමට මෙන්ම ඒ තුළ සමූහාණ්ඩුවක් ඇති කිරීමට අපේක්ෂා කිරීම.
- ඉතාලිය එක්සත් කිරීමේ කාර්යය විදේශ ආධාරයකින් තොරව ඉතාලි ජාතිකයන්ට පමණක් ක්‍රියාත්මක කළ හැකි යයි තරයේ විශ්වාස කිරීම.
- 1831 – 1848 දක්වා කාලය තුළ ඔහු විසින් වරින් වර කරන ලද සටන් අසාර්ථක වුවත් ඉතාලි ජාතිකයන් තුළ ජාතිකත්වය පිළිබඳ හැඟීම රෝපණය කිරීමට හා ප්‍රචලිත කිරීමට ඔහු සමත් වීම.

**II කැව්වර්**

- මොහු 1852 – 1861 දක්වා පීඩ්මොන්ට් - සාර්ඩිනියා රාජ්‍ය අගමැතිවරයා ලෙස ක්‍රියා කිරීම.
- ඉතාලි එක්සත් ව්‍යාපාරයේ වැඩිම කාර්යය භාරයක් ඉටුකළ පුද්ගලයා හා නායකයා මොහුය.
- ඉතාලිය එක්සත් කිරීමේ නායකත්වය ගැනීමට සුදුසු වන ආකාරයට දේශපාලන හා ආර්ථික වශයෙන් එම රාජ්‍ය ගොඩනැගීම, එම රාජ්‍ය සංවර්ධනය කිරීමට පියවර ගැනීම.
- ඉතාලිය එක්සත් කිරීමට, ඉතාලිය තුළ තිබූ ඔස්ට්‍රියානු බලය පරාජය කළයුතු වූ බැවින් ඒ සඳහා විශේෂ ආධාර අවශ්‍ය බව කල්පනා කිරීම. ඒ අනුව විදේශ ආධාර ලබා ගැනීමට ක්‍රියා කිරීම( ප්‍රංශයේ III නැපෝලියන් හෙවත් ලුවි නැපෝලියන්)

**III ගැරිබෝල්ඩි**

- සටන් කාමියෙකු වූ ගැරිබෝල්ඩි රතු කමිස හමුදාව ගොඩ නැගීම.
- දකුණු ඉතාලියේ තිබූ සිසිලිය රාජ්‍ය බුර්බෝන් පාලකයන්ගෙන් මුදවාගෙන පීඩ්මොන්ට් - සාර්ඩිනායා රාජ්‍ය වෙත ලබා දීම.
- 1861 සාර්ඩිනියාවේ වික්ටර් එමැනුවෙල් රජු ලෙස ප්‍රකාශයට පත්කිරීම.
- මේ ආකාරයට ඉතාලිය එක්සත් කිරීම ලිබරල්වාදී මැසිනිගෙන් ප්‍රායෝගික රාජ්‍යතාන්ත්‍රිකයෙකු වූ කැව්වර්ගෙන් , විප්ලවවාදී සටන් කාමිකයෙකු වූ ගැරිබෝල්ඩි ගෙන් ප්‍රයත්නයන් හා සාපේක්ෂව ප්‍රතිඵලයක් ලෙස සඳහන් කළ හැකිය.

අන්තර්ගතය සකස් කිරීම : පී. ජී. එන්. දිවාංගනී මිය - ර/ ශ්‍රී නාරද මහා විද්‍යාලය , බලන්ගොඩ ,
එම්. ජනක පෙරේරා මයා - ර/මිටිපොල මහා විද්‍යාලය, ඇහැලියගොඩ
පරිගණක පිටු සකස් කිරීම : බී.එස්.එස්.කේ. රුහුණගේ මිය- බප/ජය/මුනිදාස කුමාරතුංග විද්‍යාලය, කඩුවෙල
අන්තර්ගතය පරීක්ෂා කිරීම : ඩබ්. දමයන්ති බණ්ඩාර මිය- කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල
Copyright © www.e-thaksalawa.moe.gov.lk

## ප්‍රශ්න අංක 03

- **1815 – 1848 දක්වා කාලය තුළ ඉතාලිය එක්සත් කිරීමට දරන ලද ප්‍රයත්නයන් විස්තර කොට ඒවා අසාර්ථක වූයේ මන්දැයි සාකච්ඡා කරන්න.**

  * 1818 වියානා සමථය මගින් ඉතාලිය බෙදා වෙන් කර තිබීම.
  * කාබොනාරි ව්‍යාපාරය , මැසිනිගේ තරුණ ඉතාලි සංගමය වැනි සංවිධාන ඉතාලිය එක්සත් කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කිරීම.
  * ජනතාව තුළ ජාතික හැඟීම් හා එක්සත්කම වර්ධනය කිරීමට කටයුතු කිරීම.
  * ඉතාලිය එක්සත් කිරීම සඳහා දරණ ලද ප්‍රයත්නය.
  * 1820 දී කාබොනාරි ව්‍යාපාරයේ නායකත්වයෙන් නේපල්ස් හි II ෆර්ඩිනන්ඩ් රජුට එරෙහිව කැරලි ඇති කිරීම.
  * 1821 දී කාබොනාරි ව්‍යාපාරය මෙහෙයවීමෙන් ඔස්ට්‍රියානු පාලනයට එරෙහිව ලෝම්බාර්ඩිහි ජනතා නැගීසිටීම.
  * 1830 දී ප්‍රංශ ආධාර අපේක්ෂාව ඇතිව පර්මා මොඩිනා, ටස්කනි රාජ්‍යවල ජනතාව කැරලි ගැසීම.
  * 1853 දී ස්විට්සර්ලන්තයේ සිටි මැසිනි , සැවෝයිහි ජනයා චාර්ල්ස් ඇල්බට් රජුට එරෙහිව නැගී සිටිනු පිණිස මෙහෙයවීම.
  * 1848 දී සිසිලි ජනතාව නේපල්ස්හි II ෆර්ඩිනන්ඩ් රජුට විරුද්ධව සටන් මෙහෙයවීම ලොම්බාර්ඩ් , මිලාන් යන ප්‍රදේශවල කැරළි ඇතිවීම. මැසිනි පාප් රාජ්‍යයට අයත් ප්‍රදේශවල සමූහාණ්ඩුවක් ප්‍රකාශයට පත් කිරීම.

- **ප්‍රයත්න අසාර්ථක වීමට හේතු**
  * ඉතාලි රාජ්‍ය අතර එකමුතුකමක් නොතිබීම හා ඉතාලි ජාතිකයන් තුළ ප්‍රමාණවත් තරම් ජාති වාත්සල්‍යයක් නොතිබීම.
  * ඉතාලි රාජ්‍ය වලින් විශාල ප්‍රමාණයක් විදේශීය ආධිපත්‍ය යටතේ පැවතීම. විශේෂයෙන්ම එහි පැවතියා වූ ඔස්ට්‍රියානු ආධිපත්‍යය.
  * 1920 කැරලි අසාර්ථක වීම - II ෆර්ඩිනන්ඩ් රජු වියානා බලවතුන්ගේ ආධාර ලබාගෙන කාබොනාරි ව්‍යාපාරය මර්දනය කිරීම.
  * 1830 සටන් ද ඔස්ට්‍රියානු හමුදා බලය යොදා මර්දනය කිරීම.
  * පාප් වහන්සේගේ බලපෑම් 1848 කැරලි අවස්ථාවේ ජනතාව අපේක්ෂා කළ ආධාර ලබාදෙනවා වෙනුවට පාප් වහන්සේ ඒවාට විරුද්ධව කටයුතු කිරීම.
  * 1848 ඇති වූ විප්ලව ඔස්ට්‍රියානු හමුදා විසින් මර්දනය කිරීම.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය සකස් කිරීම : පී. ජී. එන්. දිවංගනී මිය - ර/ ශ්‍රී නාරද මහා විද්‍යාලය , බලන්ගොඩ ,
එම්. ජනක පෙරේරා මයා - ර/මිටිපොල මහා විද්‍යාලය, ඇහැලියගොඩ
පරිගණක පිටු සකස් කිරීම : බී.එස්.එස්.කේ. රුහුණගේ මිය- බප/ජය/මුනිදාස කුමාරතුංග විද්‍යාලය, කඩුවෙල
අන්තර්ගතය පරීක්ෂා කිරීම : ඩබ්. දමයන්ති බණ්ඩාර මිය- කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල
Copyright © www.e-thaksalawa.moe.gov.lk

## 06. ග්‍රීක පෞර රාජ්‍ය

| | |
|---|---|
| • ඇතැන්ස් - දියුණුම පෞර රාජ්‍යයයි | • ස්පාටා - විශාලතම පෞර රාජ්‍යයයි |
| • කොරින්ත් | • මෙයාරා |
| • මිටිලින් | • මිලෙටස් |
| • ආර්ගෝස් | • කෝස් |
| • ඩිලෝස් | • ලෙස්බෝස් |

**නොගැළපෙන නම**

1. ලිඩියා
2. ඇතැන්ස්
3. ස්පාටා
4. කොරින්ත්
5. මිලෙටස්

**(A/L 2024)**

1. ස්පාටා
2. කොරින්ත්
3. ඇතැන්ස්
4. මිලෙටස්
5. ගෝල්

**(A/L 2020)**

1. තිබ්ස්
2. මෙගාරා
3. මර්මරා
4. කොරින්ත්
5. මිලෙටස්

**(A/L 2018)**

**තෝරන්න**

1. ඔලිම්පස්
2. සමෝස්
3. ලෙස්බෝස්
4. කෝස්
5. ඩිලෝස්

**(A/L 2017)**

1. ඇතැන්ස්
2. තිබ්ස්
3. කොරින්ත්
4. මිලෙටස්
5. ඇක්‍රොපොලිස්

**(A/L 2021)**

## ග්‍රීක පාලන යන්ත්‍ර

- රාජාණ්ඩුව
- කතිපයාධිපති
- ප්‍රජාතන්ත්‍රවාදය
- ප්‍රභූතන්ත්‍රය
- ප්‍රජා පීඩක

- **නොගැළපෙන නම තෝරන්න**

1. රාජාණ්ඩුව
2. කතිපයාධිපති ආණ්ඩුව
3. පූජක තන්ත්‍රය
4. ප්‍රජා පීඩක පාලනය
5. ප්‍රජාතන්ත්‍රවාදය

**(A/L 2019)**

1. රාජාණ්ඩුව
2. කතිපයාධිපති ආණ්ඩුව
3. ප්‍රජා පීඩක පාලනය
4. අධිරාජ්‍යය
5. ප්‍රජාතන්ත්‍රවාදය

**(A/L 2020)**


Copyright © www.e-thaksalawa.moe.gov.lk

## ග්‍රීක දේවමණ්ඩලය

- සියුස් —> අහසට අධිපති /දේව මණ්ඩලයේ ප්‍රධානියා
- ඇතීනා —> ප්‍රඥාව / නීතියට අධිපති
- ඇපලෝ —> සූර්යය දිව්‍යරාජයා
- ප්‍රොසයිඩන් —> මුහුදට අධිපති
- ඒරස් —> යුද්ධයට අධිපති
- ඇෆ්‍රොඩයිට් —> ප්‍රේමයට අධිපති
- හර්කියුලිස් —> පොළොව උසුලාගෙන සිටින්නා
- ඩයනීසස් —> සුරාවට ( වයින්පානයට) අධිපති
- ආටිමිස් —> සඳු දෙවඟන

**නොගැළපෙන නම තෝරන්න**

1. ජුපිටර්
2. සියුස්
3. මිනර්වා
4. වීනස්
5. නෙප්චූන්

**(A/L 2024)**

**නොගැළපෙන යුගලය තෝරන්න.**

1. සියස් - අහසට අධිපති දෙවියා
2. ඇතීනා - ප්‍රඥාව අධිපති හා ශිල්ප කලාවන්ට අධිපති දෙවගන
3. නෙප්චූන් - සුරාවට අධිපති දෙවියා
4. ඇෆ්‍රොඩයිට් - ප්‍රේමයට අධිපති
5. ප්‍රොසයිඩන් - මුහුදට අධිපති

**(A/L 2023)**

## ග්‍රීක දාර්ශනිකයෝ

- ප්ලේටෝ - පරමාදර්ශී රාජ්‍ය, සමූහාණ්ඩුව
- සොක්‍රටීස් - ප්‍රශ්නෝත්තර තර්ක ක්‍රමය, සද්භාවය වූ කල් දැනුමයි
- ඇරිස්ටෝටල් - දේශපාලන විද්‍යාවේ පියා
- පයිතගරස් - පයිතගරස් න්‍යාය
- හිපොක්‍රටීස් - බටහිර වෛද්‍ය විද්‍යාවේ පියා, සෑම රෝගයකටම ස්වභාවික හේතුවක් ඇත.
- ආකිමිඩිස් - ජලෝත්පීඩන න්‍යාය
- හෙරඩෝටස් - ඉතිහාසයේ පියා, පර්සියානු යුද්ධය
- ඩිමෝක්‍රටීස් - පරමාණුක න්‍යාය
- ඇනක්සිගොරස්
- ඇනක්සි මැන්ඩල්
- ඇනක්සි මිනිස්
- එම්පරඩොරස්

(ඇනක්සිගොරස්, ඇනක්සි මැන්ඩල්, ඇනක්සි මිනිස්, එම්පරඩොරස් — ගණිතඥයන් / පෘථිවිය නිර්මාණවාදය)

Copyright © www.e-thaksalawa.moe.gov.lk

**නොගැළපෙන නම තෝරන්න**

1. හේලිස්
2. ඇනක්සි මින්ස්
3. ඊඩිපස්
4. පයිතරස්
5. ඩිමෝක්‍රිටස්

**(A/L 2023/2024)**

**නොගැළපෙන යුගලය තෝරන්න.**

1. හිපොක්‍රටීස් - සෑම රෝගයකටම ස්වභාවික හේතුවක් ඇත.
2. සොක්‍රටීස් - සද්භාවය වූ කලී දැනුමයි.
3. ඇරිස්ටෝටල් - රජය යනු ස්වභාවධර්මයේ නිර්මාණයයි.
4. නිකලෝ මැකියාවෙල් - පාලකයාගේ උත්තරීතර යුතුකම වන්නේ ස්වකීය රාජධානියේ බලය සහ ආරක්ෂාව පවත්වාගෙන යාමයි .
5. නැපෝලියන් බොනපාට් - මම පැමිණියෙමි. මම දුටිමි. මම ජය ගනිමි.

**(A/L 2023/2024)**

## ග්‍රීක සාහිත්‍යධරයෝ

නාට්‍යකරුවන්
* ඊස්කිලස් - ද පර්සියන්, ද ඔරෙස්ටියා
* සොෆොක්ලීස් - ඊඩිපස් රෙක්ස්, ඇන්ටිගන්, ඉලෙක්ට්‍රා
* යුරිපිඩීස් - ට්‍රොජන් විමෙන්
* හෝමර් - ඉලියඩ් හා ඔඩෙසි
* ඇරිස්ටෝෆනීස් - ද ෆ්‍රොග්ස්, ද ක්ලවුඩ්ස්

ඉතිහාසඥයින්
* හෙරඩෝටස් - පර්සියන් යුද්ධය
* තියුසිඩීස් - පෙලපෙනීසියානු යුද්ධය
* පැසිසීඩීස් - ඉතිහාසය පිළිබඳව

* ප්ලේටෝ - සංවාද, සමූහාණ්ඩුව
* හෙසියඩ් - වැඩ සහ දවස්
* ඩෙමස්තිනස් - දක්ෂ කථිකයෙකි

කවියන්
* සෆෝ
* පින්ඩාර්

**නොගැළපෙන නම තෝරන්න**

1. ඊස්කිලස්
2. සොෆොක්ලිස්
3. යුරිපීඩිස්
4. ටැසිටස්
5. ඇරිටෝෆනීස්

**(A/L 2021)**


Copyright © www.e-thaksalawa.moe.gov.lk

**නොගැළපෙන යුගලය තෝරන්න.**

1. හෝමර් - ඔඩෙසි
2. සොෆොක්ලීස් - ඊඩිපස් රෙක්ස් ඇරිස්ටෝටල්
3. ඇරිස්ටෝෆනීස් - ද ක්ලවුඩ්ස් (වළාකුළු)
4. සොක්‍රටීස් - දේශපාලනය
5. ප්ලේටෝ - සමූහාණ්ඩුව

**(A/L 2023/2024)**

## 07. රෝම ශිෂ්ටාචාරය

### රෝම දේව මණ්ඩලය

* ජුපිටර් - අහසට අධිපති, දේව මණ්ඩලයේ ප්‍රධානියා
* මිනර්වා - ප්‍රඥාවට හා ශිල්පීන්ට අධිපති දෙවඟන
* වීනස් - ප්‍රේමයට අධිපති දෙවඟන
* නෙප්චූන් - මුහුදට අධිපති දෙවඟන
* මාර්ස් - යුද්ධයට අධිපති
* සෙරස් - අස්වැන්නට අධිපති

**නොගැළපෙන නම තෝරන්න**

1. ජුපිටර්
2. සියුස්
3. මිනෙර්වා
4. වීනස්
5. නෙප්චූන්

**(A/L 2024)**

**නොගැළපෙන යුගලය තෝරන්න.**

1. ජුපිටර් - අහසට අධිපති
2. මාර්ස් - හිරු දෙවියා
3. මිනර්වා - ප්‍රඥාවට හා ශිල්පීන්ට අධිපති දෙවඟන
4. වීනස් - ප්‍රේමයට අධිපති දෙවඟන
5. නෙප්චූන් - මුහුදට අධිපති දෙවඟන **(A/L 2020)**

1. සියුස් - ජුපිටර්
2. ඇතීනා - මිනෙර්වා
3. ඇපලෝ - ආර්ටිමිස්
4. ඇප්‍රොඩයිටි - වීනස්
5. ප්‍රොසයිඩන් - නෙප්චූන්

**(A/L 2017)**

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## රෝම සාහිත්‍යය

* වර්ජිල් - ඊනිඩ් කෘතිය, එක්ලෝගස්, ජියෝජික්ස්
* ලිවි - ඉත්හාස ග්‍රන්ථ 142 රචනා කිරීම
* හොරස් - ඕඩස්, එපෝඩස්, සැටිරස්, එපිස්ට්ලස්,ආස්- පොයෙටිකා
* ප්ලිනි - නැචුරාලිස් හිස්ටෝරියා
* මාක්ස් අවුරේලියස් - චිත්ත සමාධිය
* ඕවිඩ්
* ටැසිටස්
* ජුවෙනල්
* ප්ලූමාක්
* සෙනෙකා

(ඕවිඩ්, ටැසිටස්, ජුවෙනල්, ප්ලූමාක්, සෙනෙකා) - ලතින් සාහිත්‍යධරයෝ

**නොගැළපෙන නම තෝරන්න**

1. හොරස්  
2. ඕවිඩ්  
3. ලිවි  
4. ටැසිටස්  
**5.** ඇලරික්

**(A/L 2018)**

1. ටොලමි  
2. වර්පිල්  
3. හොරස්  
4. ඕවිඩ්  
5. ජුවෙනෙල්

**(A/L 2020)**

## රෝම අධිරාජ්‍යවරු

* ඇන්ටොනිනස් පියුස්
* ට්‍රාජන්
* හේඩ්‍රියන්
* මාක්ස් අවුරේලියස් - චිත්ත සමාධිය පොත ලිවීම
* ජුලියස් සීසර් - ගෝල් දේශය හා බ්‍රිතාන්‍ය අල්ලා ගැනීම
* ඔගස්ටස් සීසර් - රෝම ඉතිහාසයේ ස්වර්ණමය යුගය
  යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ උපත සිදුවීම
* නීරෝ - රෝමය ගිනි තැබීම
* තිබීරියස
* කැලගියුල
* ඩයොක්ලිෂන් - රෝම අධිරාජ්‍ය නැගෙනහිර හා බටහිර වශයෙන් කොටස් දෙකකට බෙදීම

Copyright © www.e-thaksalawa.moe.gov.lk



Copyright © www.e-thaksalawa.moe.gov.lk

* කොන්ස්ටන්ටයින් - ප්‍රථම වරට කතෝලික ධර්මය වැළඳ ගැනීම
